Department of Education,Sabaragamuwa Province/ Weekly School Department of Education,Sabaragamuwa Province/ Weekly School

# පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

විෂයය:- පෙරදිග සංගීතය

මාර්තු 3 සතිය

ශ්‍රේණිය :- 10

Prepared by- H.D.V.K.C.Ilangarathna
(Music Teacher:- Ke/Dehi/Gonagala K.V.

ස්වර ලිපි කියවීමේ ක්‍රම ශිල්ප - 2 4/4 Beat

පෙරදිග සංගීතයේ ව්‍යවහාරික සංගීතයේ දී ස්වර ප්‍රස්ථාරයක් වාදනය කිරීමේදී අත්‍යාවශ්‍ය කරුණක් ලෙස ගීතය හෝ වාදිතය ප්‍රස්ථාර කිරීමට යොදාගෙන ඇති තාලය පිළිබඳ අවබෝධය ඉතා වැදගත් කරුණකි. විවිධ තාල අතුරින් අපි පළමු ව එක් විභාගයක් තුළ මාත්‍රා4 බැගින් අඩංගු වන කෙහෙර්වා තාලය(මහ තනිතිත,4/4 Beat) අනුව ප්‍රස්ථාර කළ ගීතයක් වාදනය කිරීම පිළිබඳ ව සාකච්ඡා කරමු.

- මාත්‍රා හතරෙන් හතරට විභාග බෙදීම

| 1 2 3 4 | 5 6 7 8 | 9 10 11 12 | 13 14 15 16 |

ඉහත දැක්වෙන්නේ විභාග 4කින් යුත් එක් විභාගයක් තුළ මාත්‍රා හතර බැගින් ඇතුළත් ප්‍රස්ථාරයකි. මෙහි ස්වර යොදනු ලබන්නේ 1, 2, 3, 4, ආදී මාත්‍රා යටතේය. කෙටි ඉරි දෙකකින් වෙන් වූ කොටසක් විභාගයක් ලෙස හඳුන්වන අතර සෑම විභාගයක ම අඩංගු වන්නේ මාත්‍රා 4 බැගිනි.

## <u>ක්‍රියාකාරකම 01</u>

| X | X | X | X |
|---|---|---|---|
| 1 2 3 4 | 5 6 7 8 | 9 10 11 12 | 13 14 15 16 |

ඉහත රූපසටහනේ X සළකුණ සෑම විභාගයක ම පළමු මාත්‍රාවට ඉහළින් සටහන් ව ඇති අතර එම සළකුණ ට අත්පුඩිය බැගින් අත්තැලීම සිදුකරන අතර

| වන් වූ ත්‍රී ෆෝ | වන් වූ ත්‍රී ෆෝ |
|---|---|

යනුවෙන් මාත්‍රා ගණන් කරන්න. මේ සෑම මාත්‍රාවක් අතර ම කාලය එක හා සමාන බව සිහිතබා ගන්න. කිහිපවරක් මෙම ක්‍රියාකාරකම කරන්න.

පහත දැක්වෙන්නේ මාත්‍රා හතරේ තාලයට ප්‍රස්ථාරයක ඇතුලත් වන ස්වර රටාවන් කිහිපයකි.

| 1 2 3 4 | |
|---|---|
| ස ස ස ස | සෑම මාත්‍රාවක ම එක් ස්වරය බැගින් වාදනය කළ යුතු ය. |
| ස - ස ස | පළමු මාත්‍රාව ට වයන ස්වරය නොකඩවා දෙවන මාත්‍රාව අවසන් වන තෙක් වැයීම හා 3,4 මාත්‍රාවලට ස ස්වරය වැයීම |
| ස - - - | පළමු මාත්‍රාව ට වයන ස්වරය නොකඩවා හතරවන මාත්‍රාව අවසන් වන තෙක් වැයීම. |
| + ස ස ස | පළමු මාත්‍රාව නිහඬ ව සිට 2, 3 ,4 මාත්‍රා එක් ස්වරය බැගින් වැයීම. |
| ස ස ස + | 1,2,3 මාත්‍රා එක් ස්වරය බැගින් ද හතර වන මාත්‍රාව නිහඬ ව සිටීම |
| ස + ස + | 1 මාත්‍රාව වයා 2 මාත්‍රාව නිහඬව සිට 3 මාත්‍රාව වයා 4 මාත්‍රාව නිහඬව සිටීම. |
| සස සස සස සස | එක් මාත්‍රාවක ට ස්වර 2 බැගින් වැයීම. |

**<u>ක්‍රියාකාරකම</u> 02** ස්වර පුවරුවකින් වාදනය කරන්න.

| | | | |
|---|---|---|---|
| ස ස රි රි | ග - ග - | රි ග - - | ස - - - |
| ස ස + රි | ග + ග - | රිග ග - රි | ප - - - |
| සරි ගරි ගරි ස | සරි ග+ ගරි ස | ග+ ගරි ග+ ගරි | ස - - - |
| + ස රි - | ග - ග ග | + සස රි - | ග - - - |

**<u>ක්‍රියාකාරකම</u> 03**

01. මාත්‍රා හතරෙන් හතරට බෙදෙන ගීත 15 ක ලැයිස්තුවක් සකසන්න.
02. **ඔ**බ පෙර වසර වල උගත් මාත්‍රා හතරෙන් හතරට බෙදෙන ගීත වල ස්වර ප්‍රස්තාර ස්වර පුවරුවෙන් වාදනය කරන්න.

**උදා :-** කඳුපෙළ අතරේ , බැතිනා සිරිපා , දකුණ නැගෙනහිර